# ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා සිදු වූ ප්‍රහාරයන් පිළිබඳ ප්‍රකාශය

2019 අප්‍රේල් 27 වැනි දා

ශ්‍රී ලංකාවේ නොමඟ ගිය අන්තවාදී පුද්ගලයන් කණ්ඩායමක් විසින් අහිංසක පුද්ගලයන් 350කට අධික සංඛ්‍යාවකගේ ජීවිත අහිමි කරමින් තවත් සිය ගණනකට තුවාල සිදු කරමින් පාස්කු ඉරිදා මුදා හරින ලද අමානුෂික ප්‍රචණ්ඩත්වය හමුවේ AFRIEL යොවුන් ජාලය කම්පනයට සහ කනස්සල්ලට පත්ව සිටී.

මෙම ශෝකාකූල අවස්ථාවේ දී, අපගේ සිතිවිලි සහ ප්‍රාර්ථනාවන් වින්දිතයන්ගේ පවුල් සහ ඔවුන්ගේ ළබැඳින් මෙන් ම රට පුරා විසිර සිටින කිතුනු ප්‍රජාවන් සමඟ ද බැඳී පවතී. තව ද, වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රජාවන් සමඟ උරෙනුර ගැටී සාමකාමීව ජීවත් වූ නමුත් මෙම අන්තවාදී කුඩා කණ්ඩායමක ක්‍රියා කලාපය හේතුවෙන් ප්‍රතිප්‍රහාරයක භීතියෙන් ඇළලී සිටින මුස්ලිම් ප්‍රජාව කෙරෙහි ද අපගේ සිතිවිලි යොමු වේ. අපගේ ශක්තිය සහ අධිෂ්ඨානය පරීක්ෂාවට ලක් වන්නේ මෙවැනි අවස්ථාවන්හි දී ය. එබැවින්, මෙම කැළඹිලි සහගත සහ අවිනිශ්චිත අවස්ථාවේ දී අපගේ සහෝදර ජනතාව සමඟ ඒකාත්මිකව සිටීම ඉතා වැදගත් වේ.

කිතුනු පල්ලිවල සහ හෝටල්වල සිදු කරන ලද අවිචාරවත් බෝම්බ ප්‍රහාර අපි තරයේ ම හෙළා දකිමු. මෙම ප්‍රහාරයන් වහා ම සහ කඩිනමින් විමර්ශනය කරන ලෙස සහ අපරාධකරුවන් සම්බන්ධයෙන් වගකිව හැකි නිසි අධිකරණ ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස අපි බලධාරීන්ට බල කර සිටිමු. ඒ සමඟ ම, කිසිදු සම්බන්ධතාවක් නොමැති පුද්ගලයන් අසාධාරණ ලෙස අත්අඩංගුවට පත් කිරීම සහ චෝදනා එල්ල කිරීම සිදු නොකරන බවට වග බලා ගන්නා ලෙස අපි රජයට බල කරමු.

මෙම සිද්ධිය තම පටු දේශපාලන අරමුණු වෙනුවෙන් භාවිත නොකරන ලෙසත්, ඒ වෙනුවට ශ්‍රී ලංකාව නැවත ගොඩනැඟීම උදෙසා තම දේශපාලන මතිමතාන්තර අභිබවා නැඟී සිටින ලෙසත් අපි වැඩි දුරටත් අපගේ දේශපාලනඥයන්ගෙන් තරයේ ඉල්ලා සිටිමු. මෙය වගකීම පැහැර හැරීමට හෝ එකිනෙකා වෙත දෝෂාරෝපණය කිරීමට අවස්ථාව නොවේ. තමන්ගේ ම සිතිවිලි පිළිබඳව නැවත විමසා බැලීමක් සිදු කිරීමේ හදිසි අවශ්‍යතාවක් ඇති අතර ඉදිරි ගමන වෙනුවෙන් අපගේ අඩුපාඩු පිළිගැනීම ඉතා වැදගත් වේ.

ත්‍රස්තවාදයට සහ අන්තවාදයට ආගමක් නොමැති බවත්, මෙම අන්තවාදී කණ්ඩායම් පරාජය කිරීම සඳහා අප එකා වන්ව එක්සත්ව එක්සිත්ව නැඟී සිටිය යුතු බවත් අපගේ සහෝදර ශ්‍රී ලාංකිකයන්ට සිහිපත් කර දීමට අපි කැමැත්තෙමු. මෙය කෝපයට හෝ පළිගැනීමට සුදුසු කාලයක් නොවේ; යුක්තිය සහ වගකීම බලධාරීන් වෙත පමණක් පැවරිය යුතු ය. තම ක්‍රියා පටිපාටිය පිළිබඳව වගකිව යුත්තේ අන්තවාදීන් පමණක් ම මිස ඔවුන්ගේ ප්‍රජාව හෝ ආගම නොවන බව අප වටහා ගත යුතු ය. මාර්ගගතව සහ ඉන් බැහැරව යන දෙආකාරයට ම අපගේ හැසිරීම පිළිබඳව අප සැලකිල්ලෙන් කටයුතු කළ යුතු අතර අපගේ ක්‍රියාවන් තුළින් භීතිය පතුරවන්නේ නැති බවටත්, ඒවා වර්ගවාදී හෝ හිංසාකාරී හෝ කරදරකාරී නොවන බවටත් වග බලා ගත යුතු ය. වැරදි තොරතුරු පැතිරවීම වැළැක්වීම සඳහා අපි ඥානවන්තව කටයුතු කළ යුතු වෙමු.

මෙම දුෂ්කර අවස්ථාවේ දී ශ්‍රී ලංකාව ශක්තිමත්ව නැඟි සිටින බව තහවුරු කර ගැනීමට සිවිල් සමාජයක් වශයෙන් අපට වැදගත් භූමිකාවක් ඉටු කිරීමට ඇත. ප්‍රජාවන් අතර විශ්වාසය ගොඩනැංවීමට, එකමුතු බවේ සහ අන්තර්කරණයේ වැදගත්කම ප්‍රවර්ධනය කිරීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙතක් තුළින් විසඳුම් සොයා ගැනීමට වැඩි වෙහෙසක් අප දැරිය යුතු ය. අවසාන වශයෙන්, මෙවැනි ව්‍යසනයක් යළි ඇති නොවන සමාජයක් නිර්මාණය කිරීම උදෙසා අප සැමට ඇත්තේ එක් පොදු වූ වගකීමකි.